# සිංහල භාෂාව හා සාහිත්‍ය

## 11ශ්‍රේණිය

කුරහන් ඉසිමුව කළුවර බලලා

කලාප අධ්‍යාපන කාර්‍යාලය මිනුවන්ගොඩ

සිංහල අංශය

සැකසුම S.A.S සුජීව
මිනු/පස්යාල මහා විද්‍යාලය

# කුරහන් ඉසිමුව කළුවර බලාලා

අනාදිමත් කාලයක පටන් ශ්‍රී ලාංකික ගොවියා කුඹුරු ගොවිතැනට අමතරව ගොඩ ගොවිතැනේ හිද නිරත විය. හේන් ගොවිතැන හෙවත් සල ගොවිතැන මුළුමනින්ම පාහේ වැසි ජලයේ පිහිටෙන් පවත්වා ගැනුනකි. අදට ද පවතින ඇතැම් ග්‍රාම නාමයන් ගෙන් එවකට හේන් ගොවිතැන ප්‍රකටව පැවති බවට සාධක සපයයි. **ගිනිගත්හේන, පොල්ගහහේන, කන්දකැටිය හේන, වාලච්චේන (වැලිහේන)** යන උදාහරණ ඒ අතර වෙයි. විජය කුවේණි කතා පුවතින් හෙළිවන කපු වගාව පිළිබඳ තොරතුරු, තෝනිගල ශිලා ලේඛනයේ හෙළිවන උඳු , මුං වගාවන් පිළිබඳ තොරතුරු, සීගිරි කුරුටු ගී අතරින් හෙළිවන කැකිරි , වැටකොළු වගාවන් පිළිබඳ තොරතුරු, අතීත හේන් වගාව පිළිබඳ ව අපට නිහඬව කියාපායි. මෙම හේන් වගාවේදි විදි විනෝදය මිහිරි ආශ්වාදනීය අත්දැකීම් මෙන්ම විදි දුක් ගැහැට ආදිය ඇසුරින් ගෙතුණු ජන කවි විශාල සංඛ්‍යාවක් දක්නට ලැබේ. පැල් රැකීම ද හේන් ගොවිතැන හා බැඳී ගිය විශේෂාංගයකි. තම වගාවන් වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමටත්, රෑ තුන්යම නිදි වර්ජිතව ගෙවන දිවියෙ පාළුව තනිකම කාන්සිය මගහරවා ගැනීමටත්, ගොවියෝ ජනකවි ගායනා කළෝය. හුදෙකලා ව පැල තුලදීම ගොවියාගේ සිතට නැගුනු අනේකවිධ සිතුවිලි වල ස්වභාවය මෙම පැල් කවි වලින් පැහැදිලි වේ.

**කුරහන් වගාව**

වී වගාවට ප්‍රමාණවත් පරිදි ජලය සපයා ගත නොහැකි ශුෂ්ක ප්‍රදේශයන්හි ප්‍රධාන ආහාරය බවට පත් වූයේ කුරහන් ය. හීන් කුරහන්, මල් කුරහන්, බොකුටු කුරහන්, රැන කුරහන්, මහා කුරහන්, මෝර කුරහන්, පඳුරු කුරහන්, සුදු කුරහන් වශයෙන් කුරහන් වර්ග ගණනාවක් හඳුනාගත හැකිය. කටු සර බෝගයක් වන කුරහන් බීජ සිටවන්නේ නැති අතර එය වපුරන බෝගයකි. කුඹුරු ගොවිතැන සේම හේන් ගොවිතැනද සාමූහික ශ්‍රමයෙන් කළ යුතු කාර්යයකි. එය අත්තමට වැඩ කිරීම නමින් හඳුන්වයි. හේන් වගාව සඳහා සුදුසු බිමක් තෝරා ගෙන නැකතට "වල් ගෙවදීම" සිදු කෙරේ. එනම් වල් කැපීම , කැලෑව එළි කිරීම සිදු කරයි. ඇතැම් ප්‍රදේශවල මෙලෙස කැලෑ එළි කිරීම ජනවාරි මාසයේ ඇරඹෙන අතර තවත් ප්‍රදේශයක එය ඇරඹෙන්නේ අගෝස්තු මාසයේදීය. එසේ වෙනස් වන්නේ අක් වැස්ස ලැබෙන කාලය අනුවයි. අක් වැස්ස යනු අන්තර් මෝසම් වැස්සකි. වල් කෙටීම සඳහා මාසයක් පමණ ගත වේ. වියළි කාලයේදී වල් කැපීම ඇරඹෙන හෙයින් ගස් කැපූ කැලෑව හොඳින් වියළෙයි. එවිට ගිනි තැබූ විට හොඳින් දැවී යයි. වැසි ආසන්න වන විට ගැමියෝ ඒ බව අහස් ලකුණින් දැනගනිති. එවිට වැසි වැටෙන්නට දින කීපයකට පෙර හේන ගිනි තැබීමට ගොවියෝ යුහුසුළු වෙති. සඳුදා දිනය ගින්දර උපන් දවස ලෙස සලකන ගැමියා හේන් ගිනි තැබීමට සඳුදා දිනයක් තෝරා ගැනීමට උනන්දු වෙයි. මද්දහන් වෙලාවක දි "ගිනි බෝකිරීම" සිදුකරන අතර ඊට පෙර වල්

කෙටු හේනේ සිටින සතුන් පලවාහැරීම ගැමියාගේ පරිසරය විෂයෙහි පවත්නා වූද සතා සිවුපාවා කෙරෙහි පවත්නා වූද කාරුණිකභාවය පළ කරන්නකි. **"මේ වල් ඇල්ලූ බිමේ උඩ අහසින් ඉගිලෙන, කුරගානා, බඩ ගානා, පොළෝ පස් යට ඉන්නා, අපා දෙපා සිවුපා ආදී සියලු සත්වයිනි, මම මේ හේන ගිනි තියන්නයි යන්නේ. මගේ අතින් දෝෂයක් වරදක් නැත. මේ තබනා ගින්නට අළු නොවී පලයල්ලා"** ආදී යාදින්නක් කර සත්තු පලවාහැර හේන ගිනි තැබීම සිදු කරයි. දැවී ඉතුරු වූ ලොකු ලී කඳන් ගෙන හේන වටා දඬු වැට සකස් කරන ගොවියා හේනට අරියාදු කරන වනසතුන්ගෙන් හේන බේරා ගැනීම ඉන් අපේක්ෂා කරයි. වැස්ස වැටෙන්නට පෙර කුරහන් වැපිරීම සිදුකරන අතර එතැන් සිට මාස හතරක පමණ කාලයකදී අස්වැන්න ලබාගත හැකිය. නමුත් වල් කෙටීමේ සිට සමස්ත ක්‍රියාවලිය සඳහා මාස හතක පමණ කාලයක් ගතවේ. ඖෂධීය ගුණයෙන් යුතු කුරහන් මගින් රොටි, පිට්ටු, කැඳ, තලප, හැලප ආදිය සාදා ගන්නා ගැමියෝ අස්වැන්නේ ප්‍රථම කොටසින් ආහාර පිළියෙළ කොට **අගහස් පූජාව** දෙවියන් බුදුන් වෙත පවත්වයි. ඉක්බිති ගැමියෝ විහාරයේ භික්ෂූන් වෙත දන් පිළිගන්වති. අනතුරුව තම ප්‍රයෝජනයට ගනු ලබයි. කුරහන් කවි විවිධ වෘත්තීන් හා බැඳුණු ජනකවි ගණයට ඇතුළත් වේ. බොහෝ වගාවන් ගොවීන් විසින් සිදු කරනු ලැබුවද ඒ එකක් පාසාම වෙන් වෙන් වශයෙන් ජන කවි නිර්මාණය වී නොමැත. නමුත් කුරහන් වගාව සම්බන්ධයෙන් බිහිවූ ජනකවි බොහොමයක් ගැමි සමාජයේ පවතී. කුරහන් වගාව පිළිබඳවත් ඒ හා බැඳි ගැමි දිවිය පිළිබඳව යම් දැනුමක් නොමැතිව කුරහන් කවි රස විඳිය නොහැකි වේ. ජීවිතය පිළිබඳ මිනිසාගේ ප්‍රතිචාර රැස්කර තිබූ සූක්ෂම උපකරණයක් ලෙස ජනකවියේ හැඳින්විය හැකියැයි **ලුවී මැක්නිස්** ප්‍රකාශයෙන් ඒ බව පසක් වේ.

**1** දුරුතු මහේ දී කැලයට වැදිලා
මසක් පමණ කල් කැලවල් කොටාලා
මැදින් දිනේ දී වල් ගිනි තබාලා
කුරහන් ඉසිමුව කළුවර බලාලා

කුරහන් වගාව සම්බන්ධයෙන් ගැමි අත්දැකීම් සමුදායක් සංක්ෂිප්තව පළමු කවියේ ගොනු කර දක්වා ඇත. මෙම සංක්ෂිප්ත බව ජන කවියේ පොදු ලක්ෂණයකි. ජනවාරි මාසයේ පටන් ගෙන මාස දෙකක පමණ කාලයක් කැලෑව එළි කොට වියලෙන්නට හැර මාර්තු මාසයේ දී වල් ගිනි තැබීම සිදු කරයි. අනතුරුව අහස කළු කරගෙන බක්මහේ දී වැස්ස වැටෙන්නට සූදානම් වෙද්දී ගොවියෝ කුරහන් වපුරන්නට සූදානම් වෙති. මෙලෙස මාස හතරක සිදුවීමක් පද හතරකට කැටි කොට දැක්වීමට ජන කවියා සමත් ව ඇත. මාත්‍රා 18 කින් යුත් සමුද්‍රඝෝෂ විරිතින් නිර්මාණය වූ මෙම කවියේ මසක් පමණ යන යෙදුම හැරෙන්නට සෙසු සියලු පද ගැමි වහරින් ම නිර්මිතය. ඉසිමුව යන ආමන්ත්‍රණයෙන් අත්තමට වැඩ කරන **"අත්තම් කයියට"** කරන හෘදයාංගම ඇමතුමක ලක්ෂණ ප්‍රකට කරයි.









2 එල්ලවෙන්න කවිකර කිවෙමි        බොහොම
කොල්ලන්ට එති සිවුපාවෝ        බොහොම
ගෝල්ල සමග එති ඌරෝ        සැමදාම
නිල්ල අඹති සත් දවසින්        බැලුවාම

ජීවිතය ගැටගසා ගැනීමට පරිසරය සමඟ පොරබදන ගැමියා අනේකවිධ දුක්ඛ දෝමනස්සයන් විඳදරා ගනිමින් විටෙක තමන්ට එරෙහිව නැගී සිටින පරිසරයටද සතා සිවුපාවාට ද වෛර නොකර ගෙවන්නා වූ ජීවිතය සැබැවින්ම ප්‍රශංසනීය වෙයි. එල්ලවෙන්න යන්නෙන් අදහස් වූයේ හේන ඉලක්ක කොට ගෙන යන්නයි. එනම් හේන් ගොවියා බොහෝ කවි කිවේ තම හේන පිළිබඳවයි. වපුරා දින හත ගතවන විට හරිත වර්ණයෙන් මුළු පෙදෙසම පැහැබර වෙයි. නව දළු සුවඳින් සිවුපාවෝ ඒ වෙත ඇදී එති. වරින් වර පැමිණෙන ඌරන්, රිලවුන්, අලියන්, ගෝනුන්, ඉත්තෑවන් රංචු පිටින් පැමිණ ඩිංග ඩිංග කොල්ල කෑවද ගොවියාට ඉතිරි වන්නේ මහන්සිය පමණකි.

සිවුපාවෝ එති, ඌරෝ එති, යන ලෙස උක්ත ආඛ්‍යාත නිරායාසයෙන් ගැලපුනෙන් උසස් ප්‍රවීණත්වයක් ජන කවියා තුළින් මතු කිරීමට සමත් විය. ගොල්ල , නිල්ල , අඹති , කොල්ල කන්ට , එල්ල වෙන්ට යන පද ප්‍රාදේශීය ව්‍යවහාර ලක්ෂණ ප්‍රකට කිරීමෙන් ජනකවියට නවමු ජීවයක් ලැබුණු බවක් දැනෙයි.















| | |
|---|---|
| 3 මා කී දේ දෙයියනි බොරුවක් ම | නැති |
| බිම එළි වුනොත් කණු මදු බොහොම ළග | ඇති |
| ඇහැට වෙහෙස ඇත තුන් යමට නිදි | නැති |
| ගොබ කළු වෙමින් කුරහන් කිරි වැද | වැඩෙති |

හේන් ගොවියා තම දුක කීවේ දෙවියන්ටත් බුදුන්ටත්ය. මෙහිදී ගොවියා දෙවියන්ට පද තුනකින් සත්‍ය තුනක් ප්‍රකාශ කරයි. තමා සැමවිටම සත්‍ය වචන පවසන බවත් කිසිවිටෙක මුසාවක් නොපවසන බවත් ඉන් පළමුවැන්නයි. හේන් වැපිරීමට ප්‍රථම කණු මුල් ගලවා කොතරම් පිරිසුදු කර වැපිරීම කළද පැලේ උඩ සිට බලන විට හේන පුරාම කණු මුල් නවමත් විසිරී ඇති අයුරු ගොවියාට පෙනෙයි. එයින් වැඩේ "සහසුද්දෙට" හරියටම පිරිසිදුවට කෙරී නොමැති බව සිතෙන විට ඔහුට දුක දැනෙයි. නමුත් එය තමාගේ නොසැලකිල්ල නිසා, අලසකම නිසා සිදු වුවක් නොවන බව ඔහු දෙවියන්ට ප්‍රකාශ කරයි. මන්දයත් අලස ගොවියා ගම්මුන්ගෙන් දෝෂදර්ශනයට ලක් වන බැවිනි. තමා අලසෙකු නොවන බව ගොවියාගේ දෙවන සත්‍ය ප්‍රකාශයයි. ගැමියෝ රාත්‍රිය කොටස් තුනකට බෙදා දක්වා ඇත. පෙරයම , මැදියම , අලුයම ඒ රෑ තුන් යාමයයි. යන්තම් හෝ ඇස්පිය වූ විට සතා සිවුපාවාගෙන් හේනට වන අරියාදු නිසා නිදි වරා ඇසට වෙහෙස දැනෙන බව කවියා පවසයි. ගතටත් සිතටත් දැනෙන වෙහෙස කෙලින්ම නොපවසා ඇසට වෙහෙස දැනෙන බව පැවසීම උචිත යෙදුමකි. එය කවියාගේ තුන්වන සත්‍යයයි. නොදැනීම මෙම දුක විඳින්නට පටන් ගෙන මාස තුනක කාලයක් ගෙවී ඇති බැව්

කුරහන්ගොබ කළු ගැහෙන්නට පටන් ගෙන ඇති බව පැවසීමෙන් පෙනෙයි. ගොබ කලුවීම, කුන්යම නිදි නැති, බිම එළිවීම යන යෙදුම් කෙලින්ම හේන් ගොවිතැන හා බද්ධ වන වචන භාවිතයට උදාහරණයෝ වෙති.







4 හේනේ පැලේ මා විදිනා සුරුක්කන්
ඌරෝ ඇවිත් වට පිට කරති සක්මන්
වැටට උඩින් උන්අල්ලන මලක්කන්
අපොයි මගේ කිරි වදිනා කුරක්කන්

පැල් රැකීමට හේනට ගිය ගොවියා නිදිවැරීමත් තනිවම ගෙවන හුදකලා පීඩිත ජීවිතයත්, අඹුදරුවන් සිහිවීමෙන් හටගන්නා දුකත්, වන සතුන්ගෙන් ඇතිවන කරදරත් නිසාවෙන් "දහ දුක් විඳියි". මා විදිනා සුරුක්කන් යන්නෙන් ඒ බව ධ්වනිත වෙයි. සුරුක්කන් යනු දුක, වදය යන අර්ථය යි. එය "සිරෛ" යන දමිළ වචනයෙන් බිඳී ආවකි. හේන් ගොවිතැනට කරදර කරන සත්ත්වයන් අතරින් වැඩිම තර්ජනය එල්ල කරන්නා ඌරාය. උන් ඉන්නෙ රංචු පිටිනි. හේන වටේම වැට බැඳ තිබුණද ඌරෝ වැට උඩින් පැන එති. වැටට /උඩින් /උන් අල්ලන/ මලක් කන් යන යෙදුමේ කාව්‍යමය බව තීව්‍ර වන්නේ එහි යතිය නිසාවෙන් උපදින පිනුමක කරනමක චිත්තරූපය

නිසාවෙනි. එලෙස එන ඌරන් කිරිවදින කුරක්කන් කා දමන විට නගුලෙන් මෙන් හාරා තරහින් මෙන් ගස් පෙරලන විට ගොවියාට "අනේ අපොයි" කියවෙයි. මෙතෙක් කාලයක් වින්ද දුක ඇස් පනාපිට විනාශ වී යන අයුරු දකින විට පපුවෙ හටගත් ගින්දර "අපොයි" යන බෙදාර්ථ නිපාතයෙන් මොනවට පසක් වෙයි.









| | |
|---|---|
| 5 කවු ඇල්ලේ මහ හේනේ | කුරක්කන් |
| වැට අහුරා ඌරන්ගෙන් | වළක්කන් |
| කරගන්නට බැරි උන් මහ | කුරක්කන් |
| ඌරෙනි නොකා පලයව් මගෙ | කුරක්කන් |

ඇතැම් කුරක්කන් කවි ඇසුරින් එවකට පැවති ප්‍රකට කුරක්කන්හේන පිළිබඳව තොරතුරු හෙළි වෙයි. **කැන්දලන්ද, කන්දකැටිය, තබලේ ගල, කවු ඇල්ල,** එලෙස ජනකවි ඇසුරෙන් හෙළිවන කුරහන් හේන් සංඥා නාමයන් කීපයකි. මෙම කවියේ දී කවුඇල්ල ප්‍රදේශයේ පිහිටි හේනක් පිළිබඳව කියවේ. ගොවියා දඬු වැට සකස් කර ඌරන්ගෙන් හේන රැක ගන්නට අනේකවිධ උත්සාහයක් දැරුවද ඌරන්ගෙන් හේන රැක ගන්නට ගොවියා අපොහොසත් වූ බව පැවසේ. කුරහන් සුවඳට ඉව අල්ලන ඌරන් නිදි වරා පැල් රැකක්කද, වැට සවිමත් ව සකස් කළ ද හේනෙන් ඈත් කොට තබා ගැනීම අසීරු කටයුත්තකි. බැරිම තැන **"ඌරනේ මගේ කුරක්කන් නොකා පලයව්"** යනුවෙන් ගොවියාට කියැවේ. වාච්‍යාර්ථය ඉක්මවා ගිය අසරණ භාවයක් මින් ධ්වනිත කිරීමට සමත්

6 මෙදා හේන පැහිලා ඇති කුරක්කන්
රන්වන් කරල් බරවී ඇති කුරක්කන්
ඌරෝ නො කැවොත්හේනේ කුරක්කන්
බඩගින්නට අවුසදයකි කුරක්කන්

මෙදා හේන යනුවෙන් දැක්වීමෙන් කාලයකට පසු මෙවර නම් හේන හොඳින් සුරැකිව ඇති බවක් ව්‍යංගාර්ථ වත් කෙරෙයි. **රන්වන්** යනු උපමාවකි රත්‍රන්වැනි යනුවෙන් කුරහන් උපමා කිරීමෙන් හේන් ගොවියාට එහි ඇති වටිනාකම කෙතරම්දැයි කියවේ. ශුෂ්ක කලාපයේ ගැමියාගේ

ජීවිත රැක දෙන ප්‍රධාන බෝග ලෙස කුරහන් සඳහා එම උපමාව බෙහෙවින්ම උචිත බව දැනෙයි. මෙවර සරුවට කරල් බර වී ඇති අයුරු දැකීමෙන් ගොවියාගේ සන්තුෂ්ටිය මෙයින් මුදා හැර ඇත. ඌරන්ගෙන් හේන රැක ගන්නට හැකි වේ දැයි අවිනිශ්චිතය. ඌරන්ගෙන් රැක ගන්නට හැකි වුවහොත් බඩගින්නට කුරක්කන් කදිම ඖෂධයක් බව ගොවියා පවසයි. මෙහිදී ඔසු යන තත්භව වචනය වෙනුවට ඖෂධ යන තත් සම වචනයම සිංහල උච්චාරණයට පහසු ලෙස "අවුසදයකි" යන ලෙස යෙදීම උචිත භාෂාත්මක යෙදුමකි. කුරහන් රළු ධාන්‍ය වුවද ගැමියාට එය වටිනුයේ එය දිරවීමට ප්‍රමාද වන බැවින් වේලක් හැර වේලක් කැවද බඩගින්න නොදැනෙන හෙයිනි. එලෙසම කුරහන් සැබැවින්ම ඖෂධීය ගුණයෙන් ද පොහොසත් වන බැවිනි. කවියාගේ වදන් භාවිතය සැම අතින්ම උචිත බව හැඟෙයි.







07 කුරක්කන් තුනයි වැපුරුවෙ අමාරුවෙ
කපන්නටත් බැරුව අතපය රුදාවේ
හරින්නටත් බැරුව ලොවගම සිනාවේ
කපමු නැනෙ ඉපනැල්ලේ සුබා වේ

කුරක්කන් තුනයි යන්නෙන් අදහස් වන්නේ කුරක්කන් මැනීමට ගන්නා ලාහෙන් තුනක් යන්නයි. එනම් කිලෝ 12 ත් 15 ත් අතර ප්‍රමාණයකි. මෙම ගොවියා එපමණ ප්‍රමාණයක් වපුරා ගෙන ඇත්තේ අසීරුවෙනි. එය ඔහුගේ අසනීප තත්ත්වයක් හෝ පවුලේ කිසියම් කරදර තත්වයක් නිසා හෝ විය හැකිය. නමුත් ගොවියා නොසිතූ ලෙස මෙවර අස්වැන්න වෙනදාටත් වඩා සාරවත්ව වැඩිවී ඇත. එය කපා ගන්නට බැරි තරමට අතපය වේදනා ගෙනදෙයි. තවත් තනිවම එම කාර්යය කිරීමට ඔහුට බැරුවා සේය. නමුත් කුරහන් නොකපා අතහැර දැමිය නොහැකිය. මන්දයත් එසේ වුවහොත් ඊළඟ වසර ජීවත්වීමට අවැසි ආහාර නැතිව යයි. එපමණක් නොව ලද අස්වැන්න කපා ගන්න වුවමනාවක් නැති අලසයෙකු ,කම්මැලියකු, සෝමාරි යෙකු ලෙස තමාව හඳුන්වා ගම්වැසියෝ සිනහවට ලක් කරනු ඇත. විවාහ නොවුණ තරුණ ගොවියෙකුට මෙය තම විවාහයටද තදින්ම බලපායි. මන්ද එවන් අයෙකුට තම දියණිය විවාහ කර දීමට කිසිදු දෙමව්පියකු අකමැති වන බැවිනි. එහෙයින් මෙම තරුණ ගොවියා තම නැනාට කුරහන් කපන්නට ආරාධනා කරන්නේ ඇයට ද මේවායේ අයිතියක් තිබෙන බව හඟවන්නට මෙනි. එමෙන්ම ඇය අසලින් සිටින විට ගතේ වේදනාවද අමතක වී යන බැවිනි. හැඩ ට එක මට්ටමට ඉපනැල්ල ඉතිරිවන සේ කුරහන් කපා ගන්නට නැනා සිටින්නේනම් හැකිවන බවද කවියා මින් පවසන බව පෙනේ.








8 එපෙති දෙපෙති මහ හේනේ කුරක්කන්
මග යන්න මට සර දම් කරක්කන්
එපෙති වෙන්න කවුදැයි කළ නරක්කන්
කපා ගනිමු එක පෙත්තේ කුරක්කන්

සරුවට වැඩුණු කුරහන් කරලක ඇහිලි හත අටක් දක්නට ලැබෙයි. මෙම කවිය ඉදිරිපත් කරන ගොවියගේ මහ හේනේ මෙවර කුරහන් කරලක සැදී ඇත්තේ ඇහිලි එක දෙකක් පමණි. එනම් එය නිසරු හේනකි. හේනක් නිසරු වන්නට කරුණු කිහිපයක් බලපායි. වැපිරීමට පෙර නිසි ලෙස හේන් එලිපෙහෙළි කර නොගැනීම, නිසිලෙස පැල් රැකීම රැකබලා නොගැනීම ඒ අතර වෙයි. මන්ද පොහොර යෙදීම ජලය සැපයීම ආදිය කුරහන් වගාවේ දී සිදු නොවන බැවිනි. ඒ නිසා හේන නිසරු වීමට ගොවියාගේ ක්‍රියාකලාපයන් බලපාන්නේ එලෙසිනි. නිසරු හේන් දකින හේන අසලින් යන ගැමියෝ මෙම ගොවියාට උසුළු විසුළු කරයි. නිසිලෙස හේන පරිස්සම් කර ගැනීමට නොහැකි සෝමාරි අලස යෙකු ලෙස ඔවුන් මෙම ගොවියාව දකිනු නොඅනුමානය. මෙය කාගේ වරදින් සිදුවිද ගොවියා කල්පනා කරයි කවුදැයි කළ නරක් කන් කවුද මේ නරක කළේ යන ලෙස විමසීමෙන් එය තමාගේම අතපසු වීම් දුර්වලතා හේතුවෙන් සිදු වූවක් බව පෙනෙයි. එය උපේක්ෂාවෙන් විඳදරාගන්න ගොවියා එක පෙත්තේ කුරක්කන් වුවද කපා ගැනීමට සැරසෙයි. අඩු අස්වැන්නක් වුවද කුරහන් මෙම ගොවීනට මසුරන් වටී. කපා ගනිමු යන යෙදුමෙන් අත්තමට වැඩ කරන්නන් වෙත කෙරෙන ඇරයුම ත ලක්ෂණ ධ්වනිත කරයි.







වන බවක් පෙනෙයි. සමාන උච්චාරණ හේතුවෙන් තනි අකුරකින් යුත් එලිසමයකින් නැගෙන රසයට වඩා ශබ්ද මාධුර්යය නිපදවීමට ජන කවියා සමත් ව ඇත.







- ❖ උපුටාගත් ග්‍රන්ථය - සිංහල ජනකවි සංග්‍රහය
- ❖ ප්‍රකාශනය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව(
- ❖ පාඩමේ පද්‍යාවලිය අයත් වන කාව්‍ය වර්ගය - ජනකවි (කුරක්කන් කවි)
- ❖ ජනකවියේ විශේෂතා

4. ජනකවියේ ඇති විශේෂතා -

   i. පහසුවෙන් අවබෝධ කරගත හැකි වීම (සුගමත්වය හෙවත් සුබාවබෝධය)

   ii. මටසිළිටි බවින් යුතු පද ගැළපීම.

   iii. කාව්‍ය ආකෘතියේ හා බස් වහරේ ලිහිල් බව.

   iv. අව්‍යාජ අත්දැකීම් ඉදිරිපත් කිරීම.

   v. ඉත් නිරූපිත භාව ප්‍රකාශනයේ අව්‍යාජත්වය.

   vi. අදීන ප්‍රකාශන රටාව හා මනා සංයමය.

   vii. ව්‍යංග්‍යයෙන් අදහස් ප්‍රකාශනයේ ඇති ප්‍රබලතාව.

   viii. පාදාන්ත එළිසමය.

   ix. විරිත් අනුගමනය.

   x. ගීතවත්බව.

- ❖ අර්ථ විවරණ - දුරුතු මහේදි - ජනවරි මාසයෙදී
  - මැදින් දිනයේදි - මාර්තු මාසයෙදි
  - කොල්ලකන්ට - පහැරගන්නට , වස්තුව උදුරා ගන්න
  - ගොල්ල සමග - රංචු පිටින්
  - තුන්යම - පෙරයම , මැදියම , අලුයම
  - සුරුක්කන් - කරදර පිඩා
  - වළක්කන් - වළක්වා ගනිම
  - අවුසදයකි - ඔසුවකි , ඖෂධ වර්ගයකි
  - රුදාව - වේදනාව , රිදීම
  - සුබාවේ - ස්වභාවය
  - නරක්කම් - නරක වැඩ , අරියාදුව , අපරාදය

කෙටි පිළිතුරු ලියන්න

Iකොටස

- කුරක්කන් කවි අයත් වන්නේ කවර කාව්‍ය ප්‍රවර්ගයටද?
- කුරක්කන් කවි වලින් ප්‍රකාශ වන්නෙ කුමක්ද ?
- කුරක්කන් වගාවේදි ගොවියා මුහුණදෙන අභියෝග තමානවාද?
- කුරක්කන් වපුරන්නේ කුමන කාලයේද?
- වගාවට හානි කරන සතුන් නම් කරන්න?
- පද්‍ය පන්තියේ ඇතුළත් කාව්‍යාලංකාර (2) නම් කරන්න?

7

"හේනේ පැලේ මා විදිනා සුරුක්කන්
උෟරෝ ඇවිත් වට පිට කරති සක්මන්
වැටටත් උඩින් උන් අල්ලන මලක්කන්
අපොයි මගේ කිරි වදිනා කුරක්කන්"

අ . ඉරි ඇදි පද වල අර්ථය ලියන්න.

ආ . මෙම පද්‍යයේ ඇතුළත් කාව්‍යාලංකාර 2ක් ලියන්න.

"දුරුතු මහේ දී කැලයට වැදීලා
මසක් පමණ කල් කැලවල් කොටාලා
මැදින් දිනේදී වල් ගිනි තබාලා
කුරහන් ඉසිමුව කළුවර බලාලා "

අ . ඉරි ඇදි පද වල අර්ථය ලියන්න.

ආ . කැලය කැපිම හා වල් ගිනි තබන මාස නම් කරන්න .

එල්ල වෙන්ට කවි කර කීවෙමි බොහොම
කොල්ල කන්ට එති සිවුපාවෝ බොහොම
ගොල්ල සමඟ එති ඌරෝ සැමදාම
නිල්ල අඹති සත් දවසින් බැලුවාම

අ . ඉරි ඇදි පද වල අර්ථය ලියන්න.

ආ. සමස්ත පද්‍යයේම අර්ථය ලියන්න.

"එපෙති දෙපෙති මහ හේනේ කුරක්කන්
මග යන්නෝ මට සරදම් කරක්කන්
එපෙති වෙන්ඩ කවුදැයි කළ නරක්කන්
කපා ගනිමු එක පෙත්තේ කුරක්කන්"

අ . ඉරි ඇදි පද්‍යයේ කව්‍යාලංකාර නම් කරන්න

ආ .නරක්කන් , සරදම් යන වචන වල අර්ථය ලියන්න

## විචාර ප්‍රශ්න

කුරක්කන් වගාවේදි ගොවියා මුහුණ දෙන අභියෝග ජය ගැනිමට ගන්නා උත්සහය පැහැදිලි කරන්න (පහත සදහන් උදාහරණ යොදා ගනිමින් විස්තර කරන්න )

Ex 1

"දුරුතු මහේ දී කැලයට වැදීලා
මසක් පමණ කල් කැලවල් කොටාලා
මැදින් දිනේදී වල් ගිනි තබාලා
කුරහන් ඉසිමුව කළුවර බලාලා"

Ex 2

" කොල්ල කන්ට එති සිවුපාවෝ බොහොම
ගොල්ල සමග එති ඌරෝ සැමදාම "

" හේනේ පැලේ මා විඳිනා සුරුක්කන්
ඌරෝ ඇවිත් වට පිට කරති සක්මන්
වැටටත් උඩින් උන් අල්ලන මලක්කන්
අපොයි මගේ කිරි වදිනා කුරක්කන් "

" රන්වන් කරල් බර වී ඇති කුරක්කන්
ඌරෝ නොකෑවොත් හේනේ කුරක්කන් "

" කුරක්කන් තුනයි වැපිරුවේ අමාරුවේ
කපන්ටත් බැරුව අතපය රුදාවේ "

ජන කවියේ ඇති අව්‍යාජත්වය කුරක්කන් කවි පද්‍ය පන්තියෙන්ද නිරූපණය වේ . උදාහරණ සහිතව විමසන්න

(පහත සදහන් උදාහරණ යොදා ගනිමින් විස්තර කරන්න)

Ex 1

"දුරුතු මහේ දී කැලයට වැදීලා
මසක් පමණ කල් කැලවල් කොටාලා
මැදින් දිනේදී වල් ගිනි තබාලා
කුරහන් ඉසිමුව කළුවර බලාලා"

Ex 2

"ගොල්ල සමග එති ඌරෝ හැමදාම
නිල්ල අඹති සත් දවසින් බැලුවාම"

"හේනේ පැලේ මා විඳිනා සුරුක්කන්
ඌරෝ ඇවිත් වටපිට කරති සක්මන්"

"ඇහැට වෙහෙස ඇත තුන් යමට නිදි නැති
ගොබ කළුවෙමින් කුරහන් කිරි වැද වැඩෙති"

"රන්වන් කරල් බර වී ඇති කුරක්කන්
ඌරෝ නොකෑවොත් හේනේ කුරක්කන්"

"කටු ඇල්ලේ මගෙ හේනේ කුරක්කන්
වැට අහුරා උෟරන්ගෙන් වළක්කන්
කර ගන්නට බැරි උන් මහ කුරක්කන්
උෟරෙනි නොකා පලයව් මගේ කුරක්කන් "